**හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.1 ඡේදයේ (අ),(ආ),(ඇ), (ඈ), (ඉ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු. 330,000 ක ඉඩම් හා ගොඩනැගිලි 05ක් ගිණුම් ගත කර නොතිබුණු අතර ගබඩා ලේඛනයේ සඳහන් ඒකක 119 ක් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. තවද, ස්ථාවර වත්කමක් රු.550,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මුල්‍ය ප්‍රකාශන වල දක්වන ලද ගිණුම් ශේෂ 06 ක ශේෂයන් ඊට අදාල උපලේඛණ වල සඳහන් ශේෂයන් සමග සැසඳීමේ දී රු. 1,663,112 ක වෙනසක් පැවතුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂ ඇති නොවීමට කටයුතු කරන බව | වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

1.6.3. විගණනනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු එකතුව රු.3,525,903 ක යන්ත්‍ර හා උපකරණ ඒකක 62 ක් හා රු.356,341 ක ආයුර්වේද තොගයට අදාළ ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ලේඛන පරීක්ෂා කර බලා ප්‍රමාණය සටහන් කිරීමට කටයුතු කරන බව | අවශ්‍ය ලිපිලේඛන පවත්වා ගත යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | | | |
| | 1988 මැයි 17 දිනැති අංක 1988 / 22 දරණ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපල තක්සේරුව වසර 5 කට වරක්වත් සිදුකළ යුතු වුවද 2013 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ද වරිපනම් බදු අයකර තිබුණි. | 2024 වර්ෂය සඳහා වරිපනම් බදු අය කිරීම සිදුකරන බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,029,652 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.2,328,001 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල්කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස්කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,847,160 | 4,621,751 | 3,950,978 | 1,154,233 | 4,294,300 | 5,288,672 | 5,478,464 | 1,760,691 |
| (ii) | කඩ කුලී | 7,433,000 | 4,545,010 | 4,356,413 | 2,549,918 | 6,132,600 | 2,135,839 | 2,218,859 | 2,400,253 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,480,000 | 3,124,423 | 3,124,423 | - | 866,200 | 2,327,862 | 2,327,862 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,573,500 | 9,333,583 | 3,011,499 | 8,367,334 | 81,723,134 | 17,970,936 | 21,212,496 | 4,607,719 |
| | | 20,333,660 | 21,624,767 | 14,443,313 | 12,071,485 | 93,016,234 | 27,723,309 | 31,237,681 | 8,768,663 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් බදු<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඒකක 111 කින් රු.395,330 ක හිඟයක් පැවති අතර එම ශේෂ තුළ ඒකක 90 කින් වසර 05 කට වැඩි කාලයක සිය අය විය යුතු රු.326,773 ක ශේෂයක් පැවතුණි. | මුදල් අය කර ගැනීම සඳහා ඉදිරියේදී නිත්‍යානුකූලව කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අය කළ යුතුය. |

(ආ) කුලී

------

| | | | |
|---|---|---|---|
| i. | 2014 වර්ෂයේ සිට හිඟව පවතින පොදු වෙළඳපොල කඩකාමර 12 කින් රු.2,214,532 ක හිඟ කඩකුලී සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටද අයකරගෙන නොතිබුණු අතර රිකිල්ලගස්කඩ උප කාර්යාලයට අයත් බල ප්‍රදේශයේ කඩ 14 ක හිඟ හිටි කඩකුලිය රු.136,536 ක් වන අතර එය වසර 01 සිට 03 ට වැඩි කාලයක හිඟ ශේෂයන් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නඩු පැවරීමට අදාළ ලිපි ලේඛන සකස් කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කරන ලද බව | හිඟ ආදායම් අය කළ යුතුය. |
| ii. | රිකිල්ලගස්කඩ පොදු වෙළඳපොල පිහිටි කඩ කාමර 6 ක් හා හඟුරන්කෙත හා හේවාහැට නගරයේ කඩ කාමර 20 ක් බදු දීමට කටයුතු නොකර වසා දමා තිබුණි. | මෙම ගොඩනැගිලි සංවර්ධනය කිරීමට අවශ්‍ය අනුමැතිය සඳහා යොමු කොට ඇති බව. | අළුත්වැඩියා කර සභා දේපල ආරක්ෂා කිරීමට පියවර ගත යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 492,584 ක් හා මුද්දර ගාස්තු රු.7,874,750 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

(ඈ) වෙනත් ආදායම්

--------------------

| | | |
|---|---|---|
| 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තියට අනුව, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා තිබුණු ඉඩමකින් විකුණුම් වටිනාකම මත රු.79,570 ක බදු අයකර නොතිබුණි. | මුදල කඩිනමින් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව | ඉතිරි මුදල් අයකළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 පනතින් පවරා ඇති කාර්යය ඉටු කිරීම.

-------------------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **අතුරු ව්‍යවස්ථා**<br>2011 ඔක්තෝබර් 06 දින අංක 1726/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කුලී රථ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා පනවා ගෙන වසර 12 ක් ඉක්මවා තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන තෙක් මෙම වාහන නවතා තැබීමේ ස්ථාන හඳුනාගෙන ගාස්තු අය කර නොතිබුණි. | මෙම තත්වය මහ හරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින බව | අතුරු ව්‍යවස්ථා නීතිමය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පලකරන ලද 2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 4 දරණ පරිසර ආරක්ෂණ පනත අනුව සමාලෝචිත වර්ෂය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර 07 ක් රු. 31,500 ක් වටිනා බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | ලිඛිතව දැනුම්දී ඇති අතර තව දුරටත් ගෙවීම් පැහැර හරින්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව | පනතේ විධිවිධාන අනුව නියාමන කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 සිට 95 දක්වා වගන්ති අනුව සභා බල ප්‍රදේශයේ ගලි රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර වෙත ගලිරථයක් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර ඇති බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභා බලප්‍රදේශය තුළ පවතින පොදු සුසාන භූමි 76 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි. | සභා බල ප්‍රදේශය තුළ පවතින සුසාන භූමි සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව | දේපල පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ පිහිටි ආයුර්වේද, ආදාහනාගර, පුස්තකාල, පෙර පසැල් වැසිකිළි යනාදි ගොඩනැඟිලි 10 ක් රිකිල්ලගස්කඩ කඩ කාමර 10 ක් හා රහතුන්ගොඩ පොල භූමියේ ගොඩනැගිලි නිසි පරිදි නඩත්තුවක් හා අළුත්වැඩියාවකින් තොරව විනාශවීමට ඉඩහැර තිබුණ අතර ඇතැම් ගොඩනැගිලි හා ඉඩම් | 2024 සංවර්ධන යෝජනා යටතේ මුල්‍ය ප්‍රතිපාදන අනුමැතිය ලැබී ඇති අතර සභා අරමුදල් මඟින් තවදුරටත් අළුත්වැඩියා කටයුතු සිදු කිරිම සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු | ආරක්ෂාව තහවුරු කළ යුතු අතර ගොඩනැඟිලි අළුත්වැඩියා කර නඩත්තු කර ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා වැට මායිම් යොදා ආරක්ෂාව තහවුරු කර නොතිබුණි. | ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති බව. | |
| (ඇ) | රිකිල්ලගස්කඩ ක්‍රීඩාපිටිය තුළ 33’x 21’ ප්‍රමාණයේ ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට කොන්ක්‍රීට් කණු යොදා යකඩ රාමුව ඉදිකර කර තිබුණද, එහි වහලය ඉදිකර නොතිබීම හේතුවෙන් භාවිතා කළ නොහැකිව පැවති අතර යකඩ රාමුව දිරාපත්වීමේ අවදානමක් පැවතුණි. | මෙම ඉදි කිරීම අවසන් කිරීම සඳහා ක්‍රීඩා සමාජය සතුව මුදල් නොමැති බව | සභා දේපල ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අනුමත කාර්ය මණ්ඩල අනුව තනතුරු 16 ක පුරප්පාඩු 35 හා තනතුරු 01 ක අතිරික්ත 07 ක් පැවතුණි. වසර 06 කට වැඩිකාලයක සිට ලේකම් තනතුර, වැඩ පරිපාලක, පෙර පාසල් ගුරු තනතුරු, ආදාහනාගාර ක්‍රියාකරු හා බැකෝ ලෝඩර් ක්‍රියාකරු තනතුරුද පුරප්පාඩුව පැවතුණි. ආයුර්වේද වෛද්‍යවරයෙකු නොමැති වීම හේතුවෙන් හඟුරන්කෙත සහ ඉඩම්පිටිය ආයුර්වේද මධ්‍යස්ථානය එක් දිනක් පමණක් රෝගී සත්කාර සේවාව සඳහා විවෘතව පැවතුණි. | මේ වන විට බඳවා ගැනීම් ද සිදු නොකරන බැවින් තව දුරටත් පුරප්පාඩු පවතින බව | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |